# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120 2171635

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1422/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 02/09/2024
පැය1630

## මාධ්‍ය නිවේදනය

### විමර්ශන සහය සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට චීන විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන්ගේ සහය.

පසුගිය දින වල දිවයින පුරා විවිධ ප්‍රදේශ වලදී පරිගණක අපරාධ වැරදි සම්බන්ධව චීන ජාතිකයින් රැසක් අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරීන් කටයුතු කරන ලදි. එසේ අත්අඩංගුවට ගන්නා ලද චීන ජාතිකයින් සන්තකයේ තිබූ ලැප්ටොප් යන්ත්‍ර හා ජංගම දුරකථන වල දත්තයන් චීන භාෂාවෙන් සඳහන් වී තිබූ බැවින් එම අත්අඩංගුවට ගැනීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීමට අපහසු තත්ත්වයක් ඇතිවිණි.

එබැවින් එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ මැදිහත්වීම මත චීන ජාතික විමර්ශන නිලධාරීන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ කරගෙන එම විමර්ශන කටයුතු සිදු කිරීමට අවශ්‍ය සහය ලබා ගැනීම සඳහා කටයුතු සලසා දී ඇත.

එලෙස විමර්ශන කටයුතු සඳහා චීන විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් 10 දෙනෙකු මෙරට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී කටයුතු කරනු ලබන අතර එම නිලධාරීන් විමර්ශන සඳහා සහයෝගය ලබාදීම සංකේතාත්මකව සනිටුහන් කරමින් **2024.09.02** වන අද දින උදෑසන **09.30**ට **අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේදී** එකඟතාවයකට පැමිනෙණ ලදි.

මෙම අවස්ථාව සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති රොහාන් ප්‍රේමරත්න මහතා හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙනිය මහතා සහභාගී විය.

මෙම අවස්ථාවට සම්බන්ධ ඡායාරූප කිහිපයක්









පොලිස් මාධ්‍ය කොට්ඨාසය.